නාඋල ප්‍රාදේශීය සභාව
මාතලේ දිස්ත්‍රික්කය
--------------------------

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 30 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 10 දිනද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජූනි 28 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 මතය
-------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට නාඋල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුල ඉදිකර තිබූ හා සංවර්ධනය කර තිබූ ගොඩනැඟිලි 02 ක වටිනාකම රු.1,096,226 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ආ) රු.3,925,697ක ලැබියයුතු කර්මාන්ත ආධාර ශේෂයක් අඩුවෙන්ද, වර්ෂයට අදාල කර්මාන්ත ආධාර රු.9,766,679 ක් හා කර්මාන්ත වියදම රු.4,708,732 ක් වැඩියෙන්ද දැක්වුණි.

(ඇ) වර්ෂයට අදාල මුද්දර ගාස්තු ආදායම රු.2,782,135 ක් හා තවත් ආදායම් ගිණුම් ශේෂ 2කට අදාලව ලැබිය යුතු ආදායම් රු.3,382,444 ක් අඩුවෙන් දැක්වුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයට අදාළ වැටුප් ප්‍රතිපූර්ණ රු.18,056,522ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු.18,374,033 ක් ලෙස දැක්වීමෙන් වැටුප් ප්‍රතිපූර්ණ රු.317,511ක් වැඩියෙන් දැක්වුණි.

(ඉ) ඉඩම් හා ගොඩනැඟිලි ශේෂය තුල වූ භෞතික පැවැත්මක් නොතිබූ රු. 86,500 ක් වටිනා ප්‍රජාශාලාවක්, රු.100,000 වටිනා ගම්සභා කාර්යාල ගොඩනැඟිල්ලක් හා රු.60,000 ක් වටිනා ඇලහැර පාරේ කඩ කිහිපයක් ගිණුම්වල දැක්වීමෙන් ඉඩම් හා ගොඩනැඟිලි ශේෂය රු.246,500 ක් වැඩියෙන් දැක්වුණි.

(ඊ) භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව සමාලෝචිත වර්ෂය අවසානයට පුස්තකාල පොත්වල වටිනාකම රු.2,688,183 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල රු.1,170,714 ක් ලෙස දැක්වීමෙන් පුස්තකාල පොත් රු.1,517,469 ක් අඩුවෙන් දැක්වුණි.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

-----------------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.2,057,283ක්වූ ගිණුම් විෂයයන් 02කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාල උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂයන් අතර එකතුව රු. 164,206 ක් වූ අසමානතා නිරීක්ෂණය විය.

1.3.3 ලැබිය යුතු ගිණුම්

---------------------

ලැබිය යුතුව තිබූ ගිණුම් ශේෂ 05ක එකතුව රු.12,737,026ක්වූ අතර වර්ෂ 05කට වැඩි කාලයක් ඉක්මවූ එකතුව රු. 179,218ක් වූ ශේෂ 03ක් ඊට ඇතුළත් වී තිබුණි.

1.3.4 ගෙවිය යුතු ගිණුම්

---------------------

ගෙවිය යුතුව තිබූ ණයහිමි ගිණුමේ ශේෂය රු.12,696,102ක්වූ අතර, වසරකට වැඩි කාලයක් ඉක්ම වූ රු.9,013,711ක ශේෂයක් ඊට ඇතුළත්ව තිබුණි.

1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

-------------------------------------

ගිණුම් විෂයයන් 03කට අදාළව ප්‍රමාණවත් සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.3,296,815 ක්වූ ගනුදෙනු සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.6 නීති,රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

---------------------------------------------------

පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 218 රීතිය | සභාවේ ඉඩම් හා ගොඩනැඟිලි සෑම වර්ෂයකට වරක් සමීක්ෂණය කළයුතු වුවද, 1987න් පසු ඉඩම් හා ගොඩනැඟිලි පිළිබඳ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| (ආ) | 2010 පෙබරවාරි 03 දිනැති අංක එස්පී/ආර්ඩී/02/10 දරන ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛයේ 3.5 වගන්තිය. | ප්‍රාදේශීය සභාව සතු ඉඩම් විධිමත් අවසරයකින් තොරව බාහිර පාර්ශව වෙත භුක්ති විඳීමට ඉඩ නොතැබිය යුතු බවට උපදෙස් දී තිබුණද, සභාව සතු කණුමුලයාය ඉඩමෙහි ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපතිවරයා තම නිවස ඉදිකර ගෙන තිබුණු අතර, වෙනත් පාර්ශවයක්ද එම ඉඩමෙහි ව්‍යාපාර පවත්වා ගෙන යමින් පැවතුණි. |

2. මූල්‍ය සමාලෝචනය

-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,465,634 ක්වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.449,746 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.3,015,888 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

-------------------------------------

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 2 ක කාල පරිච්ඡේදය තුල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ මූල්‍ය කාර්යසාධනය පිළිබඳ වැදගත් තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

(අ) මුළු ආදායම සහ වියදම අතර, අනුපාතයේ අඛණ්ඩ ඉහල යාමක් පෙන්නුම් කෙරුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාළ රු.27,194,218 ක මුළු පුනරාවර්තන වියදමින්රු.21,462,093ක මුදලක් හෙවත් සියයට 79ක් පෞද්ගලික පඩිනඩි සඳහා වැය කර තිබුණි.

2.3 ආදායම් පරිපාලනය

----------------------

2.3.1 වරිපනම් බදු

-------------

(අ) 2015 දෙසැම්බර් 31 දිනට හිඟ හිටි වරිපනම් බදු හා අධිගාස්තු පිළිවෙලින් රු.1,773,543 ක් හා රු. 585,983ක් වූ අතර, හිඟ හිටි වරිපනම් ශේෂයට වර්ෂ 05ක කාලයක් ඉක්මවූ රු.1,468,279 ක ශේෂ ඇතුළත්ව තිබුණි.

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1) වගන්තියේ විධිවිධාන අනුව අදාල කාලසීමාවන් තුලදී වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු නොකිරීම නිසා බල ප්‍රදේශයේ පිහිටි රජයේ දේපලවලින් රු.150,228 ක හිඟ වරිපනම් බදු අයකර ගෙන නොතිබුණි.

2.3.2 කඩකුලී

----------

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ හිටි කඩකුලී ශේෂය රු.339,355 ක් විය.

(ආ) 1980 දෙසැම්බර් 31 දිනැති, අංක 1980/46 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 1 ඡේදයේ විධිවිධාන පරිදි ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත කඩකාමර කුලී අය නොකර 2013 මැයි 30 දිනැති මහාසභා තීරණය මත කඩකාමර කුලී අයකර තිබුණි. ගිවිසුමෙහි වලංගු කාලය වසර 05 ඉක්මවුවද, නව ගිවිසුම්වලටද එළඹ නොතිබුණි.

2.3.3 අක්කර බදු

---------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි අක්කර බදු ශේෂය රු.23,684ක් වූ අතර එම ශේෂය වර්ෂ 06 ක කාලයක සිට නොවෙනස්ව ඉදිරියට ගෙන එමින් පැවතුණි.

2.3.4 ජල ගාස්තු

-------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ හිටි ජල ගාස්තු ශේෂය රු.236,707 ක් වූ අතර, වර්ෂ 5ක කාලයක සිට නොවෙනස්ව ඉදිරියට ගෙන එමින් පැවති හිඟ හිටි කසළ ගාස්තු ශේෂය රු.19,613ක් විය.

2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-------------------------------

උසාවි දඩ වශයෙන් රු.988,307 ක මුදලක් සහ මුද්දර ගාස්තු වශයෙන් රු.2,353,700 ක මුදලක් අයවිය යුතුව තිබුණි.

2.3.6 දැන්වීම් පුවරු ගාස්තු
----------------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තියේ (vii) (ඊ) හා xxx උප වගන්තිය අංක 520/7 දරන ගැසට් පත්‍රයේ (iv) (අ) අතුරු ව්‍යවස්ථාවේ 39 ඡේදයේ විධිවිධාන අනුව දැන්වීම් පුවරු ගාස්තු අය නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු.540,330 ක් අයවීමට තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය
--------------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා
-------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2012 වර්ෂයේ සේවය අත්හිටුවා තිබූ නිලධාරියෙකුගේ ආපදා ණය ශේෂය වූ රු.199,920 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අංක 252-6567 දරන ඩබල් කැබ් රථය 1999 ජනවාරි 23 දින අනතුරකට භාජනය වී තිබුණු අතර, එහි අළුත්වැඩියාව සඳහා වැය වූ මුදලින් රු.152,200ක් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් ප්‍රතිපූර්ණය වී නොතිබුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා
--------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ 21 වගන්තිය ප්‍රකාරව අනුමත සැලසුම් මත ඉදිකෙරෙන ගොඩනැඟිලි වෙනුවෙන් අනුකූලතා සහතික ලබාදිය යුතු වුවද, සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ දෙක තුළ ලැබී තිබුණු ගොඩනැඟිලි අයදුම්පත් 104 ක් අතුරින් අයදුම්පත් 91 ක් සඳහා අනුමැතිය ලබාදී තිබුණි. ඉන් අයදුම්පත් 43ක් සඳහා පමණක් අනුකූලතා සහතික නිකුත් කර තිබුණි.

(ආ). සභාවට පැවරී තිබුණු ඉඩම් නීත්‍යානුකූලව ඔප්පු මඟින් පවරා ගැනීමට කටයුතු කර නොතිබූ අතර, සභාව සතු සුසාන භූමි 19 ක හා රු.157,572 ක් වටිනා ගොඩනැඟිලිවල අයිතියද තහවුරු කර නොතිබුණි.

(ඇ). 2014 වර්ෂයේ ගම නැඟුම වැඩ සටහන යටතේ රු.980,000 ක් වැයකර ඉදිකර තිබූ ජල ව්‍යාපෘති 05 ක් ක්‍රියාකාරී තත්ත්වයේ නොතිබුණි.

3.3 අවිධිමත් ගනුදෙනු
---------------------

ප්‍රාදේශීය සභාවේ මහජන නියෝජිතයින්ගේ ධුරකාලය 2015 මැයි 15 දින අවසන්ව තිබියදී මැයි මාසයට අදාළ මන්ත්‍රී ඉන්ධන හා දුරකථන දීමනාව සම්පූර්ණයෙන් ගෙවා තිබුණු බැවින්, රු.13,500ක් වැඩිපුර ගෙවා තිබුණි.

3.4 සන අපද්‍රව්‍ය කළමනාකරණය

-------------------------------------

සභාවේ ට්‍රැක්ටර් හා සේවකයින් යොදවා සහ බල ප්‍රදේශයේ දෛනිකව එකතු කරන ටොන් 02 ක පමණ කසල ප්‍රමාණයක් සේරුදණ්ඩාපොල ඉඩමට ගෙන ගොස් වල දැමීමේ ක්‍රමයක් අනුගමනය කරමින් පැවති අතර එම ඉඩමෙහි කසල කළමනාකරණය සඳහා 2006 වර්ෂයේදී ඉදිකර තිබූ ගොඩනැගිල්ල හා සමාලෝචිත වර්ෂයේ රු.750,000ක් වැයකර ඉදිකළ කොම්පෝස්ට් අංගනය ඒ සඳහා භාවිතා කර නොතිබුණි.

3.5 වත්කම් කළමනාකරණය

-----------------------------

නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

---------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) වසර 2 ත්, 10 ත් අතර, කාලයක සිට භාවිතයට ගත නොහැකි වටිනාකම සඳහන් නොවන ට්‍රැක්ටරයක් හා ට්‍රේලරයක්, රු.200,000 ක් වටිනා ට්‍රේලරයක් සහ රු.130,000 ක් වටිනා ගලියක් අපහරණය කිරීමට හෝ අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ පියවර ගෙන නොතිබුණි.

(ආ) කැබ් රථයකින් වසර 04 කට පෙර ගලවා ඉවත් කළ එන්ජිම සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ) 2014 වර්ෂයේ මිලදී ගත් රු.142,10 2ක් වූ ජල මනු 44 ක් ප්‍රයෝජනයට නොගෙන ගබඩාවෙහි තිබුණි.

4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

----------------------------------------

4.1 අයවැය පාලනය

--------------------

(අ) ආදායම් විෂයයන් 03ක් සඳහා රු.20 323,716 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු නමුත්, එකී ආදායම් උපයා ගැනීමට සභාව සමත් වී නොතිබුණු අතර, ආදායම් විෂයයන් 09 ක සියයට 35 සිට සියයට 91 දක්වා පරාසයක ඉලක්කගත ආදායම් උපයා ගැනීමට සමත් වී නොතිබුණි.

(ආ) වැය විෂයයන් 16 ක් සඳහා සලසා දී තිබූ රු.837,000 ක ප්‍රතිපාදනවලින් කිසිදු වියදමක් නොදරා සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණ අතර, වැය විෂයයන් 12ක ශුද්ධ ප්‍රතිපාදනය සහ තථ්‍ය වියදම් අතර සියයට 45 සිට සියයට 95 දක්වා පරාසයක විචලනයන් පැවතුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා අනුමත අයවැය ලේඛනයේ ප්‍රතිපාදන සීමාවන් ඉක්මවා වැය විෂයයන් 13 ක රු.1,330,836 ක වියදම් දරා ඇතත්, ඒ සඳහා විධිමත් අනුමැතීන් ලබාගෙන නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුල ආදායම් හා වියදම් විෂයයන් අතර ප්‍රතිපාදන මාරු කිරීමෙන් අනතුරුවද, අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර සැළකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

4.2 අභ්‍යන්තර විගණනය

-------------------------

අභ්‍යන්තර විගණනය සඳහා ලිඛිත රාජකාරි පැවරීමකින් තොරව නිලධාරිනියක් පත්කර තිබුණු නමුත් එම නිලධාරිනියට වෙනත් රාජකාරීන්ද පවරා තිබීම හේතුවෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු වී නොතිබුණි.

4.3 විගණන හා කළමනාකරණ කමිටු

---------------------------------------

2014 අගෝස්තු 08 දිනැති අංක සීපීසී/සීඑල්ජී/1/9/1/4 දරන පළාත් පාලන කොමසාරිස්ගේ ලිපිය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමට කටයුතු කර නොතිබුණි

5. පද්ධති හා පාලන

--------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොම කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය
(ආ). අයවැය පාලනය
(ඇ). වත්කම් කළමනාකරණය
(ඈ). වාහන පාලනය
(ඉ). ණයගැති හා ණයහිමි පාලනය